ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2018 මාර්තු මස 05 වැනි දින |

## අනාගත පොලී අනුපාතික වෙනස්වීම් පිළිබඳ නොමග යවන සුළු පුවත්පත් වාර්තා සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිචාරය

ඉදිරි කාලයේදී දේශීය පොලී අනුපාතිකවල ඉහළ යෑමක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂා කරන්නේ යැයි මෑතකදී පළ වූ මාධ්‍ය වාර්තා කිහිපයක් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානය යොමුව ඇත. මෙම වාර්තාවල පොලී අනුපාතික ඉහළ යෑමක් අපේක්ෂා කිරීම සඳහා හේතු වූ සාධක ලෙස සංචිත පහළ යෑම, අපේක්ෂිත මට්ටමට වඩා වූ ඉහළ ආනයන සහ රාජ්‍ය සුරැකුම්පත්වලට අදාළ ඉහළ ගිය පොලී අනුපාතික යනාදිය දක්වා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්තමාන පුරෝකථනවලට අනුව, මෑත කාලීනව වෙළඳපොළ පොලී අනුපාතිකවල ඉහළ යෑමක් අපේක්ෂා නොකරන බව ශ්‍රී ලංකා මහ බැංකුව අවධාරණය කරයි. මතුපිට උද්ධමනය, මූලික උද්ධමනය, උද්ධමන අපේක්ෂා, පුළුල් මුදල් සැපයුමේ වර්ධනය, ණය ප්‍රසාරණය, ආර්ථික කටයුතුවල ප්‍රසාරණය මෙන්ම ජාත්‍යන්තර සංචිත මට්ටමෙහි මෑත කාලීන වෙනස්වීම්වලට අනුව තාර්කික වෙළඳපොළක් පොලී අනුපාතිකවල ඉහළ යෑමක් අපේක්ෂා කරන්නේ යැයි සාධාරණීයකරණය කළ නොහැක.

ආහාර උද්ධමනයෙහි සිදුවූ පහළ යෑමත් සමඟ අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ වේගයකින් මතුපිට උද්ධමනය මැදි-තනි අගයක මට්ටමට නැවත ළඟා වී ඇති අතර,

ඉල්ලුමෙන් ඇතිවන උද්ධමනය පිළිබිඹු කරන දර්ශකයක් වන මූලික උද්ධමනය පහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකා මහ බැංකුවේ උද්ධමන අපේක්ෂා සමීක්ෂණයට අනුව උද්ධමන අපේක්ෂා මධ්‍යස්ථ මට්ටමකට පැමිණ ඇත. උද්ධමන පීඩනයක් ඇති නොකොට සමස්ත ඉල්ලුමෙහි ඉහළ යෑමක් සඳහා තවදුරටත් අවකාශ ඇති බව පෙන්නුම් කරමින් ආර්ථික වර්ධනය ආර්ථිකයට ළඟා විය හැකි උපරිම මට්ටමට වඩා පහළ අගයක පවතී.

2017 වසර අවසානය වන විට පුළුල් මුදල් ප්‍රසාරණය සහ ණය ප්‍රසාරණය අපේක්ෂිත මට්ටම් දක්වා පහළ ගොස් ඇත. රාජ්‍ය මූල්‍ය අංශය සම්බන්ධව, ප්‍රාථමික ගිණුමේ ශේෂය සහ රාජ්‍ය ආදායම වැනි ඇතැම් දර්ශකවල වැඩිදියුණු වීමක් පෙන්නුම් කර ඇත.

විදේශීය අංශය සැලකූ විට, නිල විදේශ සංචිත 2016 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් බිලියන 6.0 හා සාපේක්ෂව වර්තමානයේදී එ.ජ. ඩොලර් බිලියන 7.9 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත. නිල සංචිතවල සංඛ්‍යාත්මක සහ ගුණාත්මක යන දෙඅංශයෙන්ම වර්ධනයක් වාර්තා වී ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුව 2017 වසරේදී දේශීය වෙළෙඳපොළෙන් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් බිලියන 1.7 ක් සහ 2018 වසරේ මේ දක්වා කාලය තුළදී එ.ජ. ඩොලර් මිලියන 284 ක් මිලදී ගෙන ඇත.

මෑතකාලීන ගෝලීය වෙළඳපොළ වර්ධනයන් සහ ආර්ථිකමය නොවන සාධක හේතුකොටගෙන ඇති වූ දේශීය අවිනිශ්චිතතා හේතුවෙන් පෙබරවාරි මාසයේදී දේශීය වෙළඳපොළ තුළ යම් විචලතාවක් ඇති වුවද, මෙම විචලතාව කෙටි කාලයක් පමණක් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. විදේශීය විනිමය වෙළඳපොළ යළි ස්ථායී මට්ටමකට දැනටමත් ළඟා වී ඇති අතර, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ තුළ වූ අවිනිශ්චිතතා සැලකිය යුතු ලෙස පහව ගොස් ඇත.

එසේ හෙයින්, පොලී අනුපාතිකවල අනාගත වෙනස්වීම් පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ අපේක්ෂා සම්බන්ධ වූ දෝෂ සහගත මාධ්‍ය වාර්තා තුළින් නොමග නොයන ලෙස පොදු මහජනතාවට අවවාද කෙරේ.